# මංමාරුව






සිසිර දිසානායක

"අර පැන්සලයා නේද ?" පින්සල ඉඳං උන්නු තැනින් නැගිට්ටා.

"හැබෑව නේන්නං" පන්හිඳටත් ඉබේම නැගිට්ටවුණා. පැන්සල එළියේ ඉඳන් ඇවිත් ඉස්සරහා පේළියක තමුන්ගේ ආසනයේ අසුන් ගත්තා. "අපි පස්සෙ කතා කරමු."
පන්හිඳයි, පින්සලයි මේ උන්නෙ මිලින්ද රූපසිංහ ඉළන්දාරියාගේ "තනි කළේ " ප්‍රසංගයේ ප්‍රේක්ෂකාගාරයේ. මෙල්බර්න් නුවර පහුගිය දා පැවැත්වුණ හොඳ වැඩ තුනකටම සහභාගි වෙන්න පන්ටයි පින්ටයි වාසනාව ලැබුණා.

ජගත් ජේ. එදිරිසිංහ හිතවතාගේ පොතුයි, සගත තැටියයි එළි දැක්වුණ කටයුත්ත ඉවර කරලායි දෙන්නම මේ එක හුස්මට "මිලන්" ගේ ප්‍රසංගයට දුවගෙන ආවෙ. එනකොට ම හිතවතෙක් වාහනය අයින් කරගෙන එතන වාහනය නවත්තගන්න ඉඩ දුන්නා.

"උඹලගෙන් එකෙකුටනං ටිකට් එකක් දෙන්නං" වරුණ සාවින්ද හිතවතා දුර තියාම කෑ ගැව්වා. දෙන්න එක්ක දනි පනි ගාලා ශාලාවට රිංගා ගත්තා. හොඳ වෙලාවට ඉන්ටර්වල් එක. නන්දන ඇතුලත්මුදලි හිතවතා තමන් ගාව තිබුණ ආසන දෙකට පන්ටයි පින්ටයි කතා කළා. එහෙම නොවෙන්න ප්‍රසංගයේ ඉතිරි බාගෙවත් බලා ගන්න වෙන්නෙ නෑ. මොක ද ප්‍රේක්ෂකාගාරය කොල්ලො




කෙල්ලන්ගෙන් පිරිලා.

"වයස මාස හයේදී මේ රටට ඇවිත් මේ ළමයා මේ කරන දේ නම් අදහාගන්නත් බෑ." තමන්ම සිංහලෙන් ප්‍රසංගය ඉදිරිපත් කරගනිමින් ගීත එකින් එක කිසිම අඩුනිකත්වයක් නැතිව ප්‍රතිභාපූර්ණව ගායනා කරන මිලන් දැකලා සතුටු කඳුළුවලින් ඇස් තෙත් කරගත්තු පන් කිව්වා.

"ඇක්සන්ට් එකක් ඇත්තෙම නෑ" අපූරුවට සිංහල උෟරුවට වචන ශබ්ද කරලා ගයන මිලන් දැකලා පින් කිව්වා.

"හරිම ස්මාර්ට් (SMART) වැඩක් !

"කාංචනා දුවගේ වැඩෙත් හරිම ස්මාර්ට්. අපි ඊකනෙ කලින් වතාවක පත්තරේට ලිව්වෙ ඔය ගැන. අපේ දරු-වන්ගේ වැඩ හරි "ස්මාර්ට්". පොලිටික්ස් නෑ; ඊකයි. සුදුසු දේට සුදුස්සා යොදා ගන්නවා." පන් ටිකක් හැඟුම් බරවෙලා කිව්වා.

"ෂෙල්ටන් ප්‍රේමරත්න මහත්තයාගේ දක්‍ෂකම්, අගය අපේ අයට පෙන්නන්න "ගී රස ගංගා" ප්‍රසංගයෙන් ඉඩක් ලැබුණ එක හරි වටිනවා. ඊක කාලීන අවශ්‍යතාවයක් වෙලයි තිබුණෙ." ඒ පින්.
"උඹ කවද්ද මෙහෙට පාත් වුණේ ?" ප්‍රසංගය ඉවරවෙලා පැන්සලයාගේ පිටට තට්ටු කරලා පින් ඇහුවා.

පන්හිඳයි පින්සලයි එක්ක එක පන්තියෙ ඉගෙන ගත්තු පන්ති මිත්‍රයෙක් " පැන්සලයා." පැන් ට එහෙම නම වැටුනෙ ඒ දවස්වල නිතරම පැන්සලක් කනේ ගහගෙන උන්නු නිසා. පැන්ගේ තාත්තා වඩු මහත්තයෙක්. පැන් ඉස්කෝලෙ අරිලා ගෙදර ගියාම තාත්තාට අත් උදව් දුන්නා. පැන්ගේ තාත්තා සාමාන්‍ය වඩු මහත්තයෙකුට වඩා නිර්මාණාත්මක දෙයක් කරන්න උනන්දු වුණ කෙනෙක්. ගමේ තොරණ, වෙසක් කූඩු, පන්සලේ පිරිත් මණ්ඩප වාගේ දේවල් වලදී අමුතුම දෙයක් කරන්න උත්සාහා කළා. දරුවන්ගේ අනාගතය ගැනත් හිතපු කෙනෙක්.

පැන්ටත් මේ හපන්කම් ඉස්මතු වෙලා ආවා. ඉගෙන ගන්නත් හපනා. අන්තිමේ නැවතුනේ ඒ නිර්මාණාත්මක හැකියාවන් හොඳට වැඩක් ගන්න පුළුවන් තැනක. පැන් නම් පැන්සල කනේ ගහගෙන උන්නේ මෝස්තරේට. දන්නැද්ද තරුණ ගැටව් ? හැබැයි ඉතින් ඒ කාලේ ඉඳලම පැන්සලෙන් මොනවා හරි බලි රූප සටහනක් ඇඳිල්ල තිබුණා. හරියට ලෙනාඩෝ ඩා වින්චිගේ රූප සටහන් වාගේ. ඇක්සය-ස් පොත්වල පිටකවර, ඩෙස් බංකු, සමහරවිට පංති කාමරේ බිත්ති විතරක් නෙවි, ගුරුවරු නැති වෙලාවට කළු ලෑල්ලේත් මේ රූප වලින් පිරිලා ගියා. මේ දේවල් පැන් කළේ නිතර කනේ ගහගෙන උන්නු පැන්සලෙන්. ඉඳලා හිටලා අහල පහළ උන්නු අයට පැන්සලෙන් ඇනලා ලොකු ඉස්කෝලෙ මහත්තයාගෙන් ගුටිකාපු වෙලාවල් තිබුණා.

"මං මචං දැන් ඉන්නේ යූ. කේ. වලනේ. මට මෙහේ පී. ආර්. තියෙනවා. ස්ටෑම්ප් කරගෙන යන්නත් එක්කයි ආවෙ. අර වොල් කැනෝ කේස් එකට අහු වුණානේ. ෆ්ලයිට් එකක් සෙට් වෙනකල් මෙහේ හිරවෙලා." පැන්ගේ කතාවේ බාගෙට බාගයක් ඉංග්‍රීසි.

"ඔය භාෂාවට අපි කියන්නෙ සිංගිරිසි කියලා. ඉංග්‍රීසියෙන් කිව්වොත් " සිංග්ලිෂ්" පන්ට තමුන් ලයනල් රන්වල සර්ට ලියපු පදවැලක් සිහි වුණා.

"ඉත්තින් ?" පින් බොහොම උනන්දුයි යාළුවා ගැන.
"මං මේ යාළුවත් එකක්යි මේ ෂෝ එකට ආවේ." පැන් තවත් කෙනෙක් එකක් කතා කර කර ඉන්න, තමන්ට නවාතැන් දෙන යාලුවාව පෙන්නුවා. " පස්සෙ ඉන්ට්‍රොඩියුස් කරන්නම්කෝ...."

"කොහොමද ඉතින් උඹලා ?" පැන් ඇහුවා.
"දන්නැද්ද ඉතින් පොඩි පොඩි සිල්ලර

37 වන පිටට

Hennessy Catering Services
Delicacies from Aurora
Catering for Any Occasion
Birthdays & Parties
Baptisms & Eucharist's
Weddings & Engagements
Anniversaries



We will provide you with:
Buriyani Lumprice
Rice & Curries Kottu Rotti
Finger foods Hoppers/ string hoppers
Deserts Cakes [for any occasion]
*Free delivery within 30km
*Food warmers available for hire
*Buffet table decoration and server available
Contact:
Ruchira Ambegoda
0432721967/0432720541
hennessycatering@yahoo.com.au
hennessycatering.wordpress.com

S&D SUPERIOR CLEANING SERVICES
DOMESTIC & COMMERCIAL CLEANING
Specializing in
* Regular Home Cleaning
* Vacating Clean
* Builders Cleaning
* Party Help/Clean Ups
* One Off Clean
* Moving Clean
* Spring Clean
* Pre-Sale Clean
T: 03 9708 6296 M: 0411314417 F: 03 9708 6940
E : sdcleanings@yahoo.com.au